## යුද්ධය යුද්ධයමයි 1 වන පිටුවෙන්

වටී. එසේ නොවන්නට කුමක් සිදුවිය හැව තිබුණේදැයි අපට සිතාගන්නට බැරිකමක් නැත

### ජාත්‍යන්තර සංවිධාන උපයෝගී කරගැන්මේ කොටින්ගේ කූට ප්‍රයත්න

කොටි පරාජය වෙමින් දිනෙන් දින පසුබසිත්ම විදේශයේ කොටි හිතවාදී දෙමළ පෙරටු සංවිධාන එක්වී ඇමරිකාව, යුරෝපා සංගමය ( EU ) සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ආදී සියළු සංවිධානවලට බලපෑම් කිරීම දිගටම ගෙනගියහ. අතේ පැලවෙන බොරු මවාපාමින් මුන් සිතා සිටියේ මෙම ජාත්‍යන්තර සංවිධාන උන්ට ඕනෑ ආකාරයට නැටවීමට හැකියයි කියාය. නමුත් ඉහතකී සංවිධාන ලංකා රජය සමග නිල වශයෙන් සාකච්ඡා කරමින්ද, යථා තත්වය විමසා බලමින්ද සුපරීක්ෂාකාරී වූහ. අප රජයද තම ක්‍රියාන්විතය මත ස්ථිරව පිහිටා සිටිමින් පැහැදිලිව ලොවට අවබෝධකර දුන්නේ කොටි ප්‍රචාරකයින් කියන අන්දමේ සාමාන්‍ය වැසියන්ට එරෙහිව කරන යුද්ධයක් නොව, කුරිරු ත්‍රස්තවාදී කණ්ඩායමක් විනාශකිරීමේ අරමුණින් නීත්‍යානුකූල රජයක් ගෙන ඇති පියවරක් බවයි. සිවිල් වැසියන් තුවක්කුවේ බලයෙන් මිනිස් පළිහක් ලෙස යොදා ගෙන ඊට මුවාවී සිටින්නේ කොටි ත්‍රස්තවාදීන් බවත්, මුරගාන කොටි ප්‍රචාරකයින්ගේ අරමුණ කොටුවී සිටින කොටිනායක යාට පැනයාමට සැලැස්වීම බවත් එම සංවිධාන නිවැරදිව අවබෝධ කරගත්හ.

මේ අතරතුර සිය ස්ථාවරයේ නොසෙල්වී සිටි ශ්‍රීලංකා රජය සහ හමුදාවන් පියවරෙන් පියවර කොටි බලය බිඳලමින් උන් කොටුකරලන ආකාරයද, රජය ඒ සිරවී සිටින ජනතාවට ආරක්ෂිත ප්‍රදේශ වෙන්කරමින් කොටි ග්‍රහණයෙන් බේරීයාමට සළස්වන ප්‍රයත්න සහ ඒවා වළක්වන්නට කොටි එම ජනතාවට නිර්දය ලෙස වෙඩි තබමින් දහලන අවසන් ජවනිකා ආදියද එම බාහිර සංවිධාන වලට දැනගන්නට සැලැස්වීය. මේවා නිවැරදිව අවබෝධ කරගත් එම සංවිධාන හැම එකකින්ම ප්‍රකාශ වූයේත්, ඔවුන් අවධාරණය කළේත් කොටි සංවිධානය වහාම ආයුධ බිම තබමින් ත්‍රස්තවාදය අත්හැරිය යුතු බවයි. රජයේ ස්ථාවරය වූයේ කොටි ආයුධ බිමතබා යටත්වූ පසු පමණක් ඊළඟ පියවරට යන බවයි. කොටි ආයුධ බිම තැබීමට එකඟ නොවූහ. ඒ වෙනුවට කොටි සටන් විරාමයක් ඉල්ලූහ. මේ ඉල්ලන අතරේම කොටි උන්ගේ සැහැල්ලු ගුවන් යානා ‘කුරුම්බැට්ටි’ පියාඹන මැෂින් දෙකක් යොදා ගනිමින් කොළඹට කරන්නට ආ ව්‍යවර්ථ වූ බෝම්බ ප්‍රහාරයෙන්ම උන් කිසිම සටන් විරාමයකට සූදානම් නැති බව කාටත් පෙනිණ.

මේ අතරතුර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් අංශයේ ප්‍රධානියාවූ සර් ජෝන් හෝම්ස් **( Sir John Homes)** ලංකාණ්ඩුවේ අනුමැතිය ඇතිව ලංකාවට පැමිණ රජය සමග සාකච්ඡා කළ අතර යුද්ධ පවතින ප්‍රදේශවලට ගොස් යථා තත්වය සවිස්තරව සොයා බැලීය.

මේ අතරේදීම එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට (UN Security Council) අළුතින් පත්වූ දකුණු ඇමරිකාවේ මැක්සිකෝව හා බ්‍රසීලය යන රාජ්‍ය දෙකේ නියෝජිතයෝ ලංකාවේ ද්‍රවිඩ මානව හිමිකම් ප්‍රශ්නය සාකච්ඡාව සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස ඉල්ලන යෝජනාවක් ඉදිර පත් කළහ. ලංකාවේ සැබෑ ප්‍රශ්නය තබා ලංකාව කොහේ තිබෙනවාදැයි කියා නොදන්නා මේ රටවල් මගින් මෙම යෝජනාව ඉදිරිපත්වීම කොටි අනුගාමිකයන්ගේ උත්සාහයේ ප්‍රථිලයකි. (මොන මොනවා මාරුවීදැයි යන්නද මේ ඇත රටවල නියෝජිතයන්ගේ හදිසි උනන්දුව කුමක්ද ආදිය ප්‍රහේලිකා වෙති.)

ආරක්ෂක මණ්ඩලයේ ප්‍රබල සාමාජිකයින් දෙපළක් වන රුසියාව සහ චීනය ශ්‍රීලංකා පිළිබඳ ප්‍රශ්නය එක්සත් ජාතීන්ගේ මණ්ඩලය සාකච්ඡාකිරීම ප්‍රතික්ෂෙප කළ යුතුය යන ස්ථාවරයේම සිටිමින් එම රටවල් දෙක ශ්‍රීලංකාවේ නියම මිතුරන් බව පෙන්වූහ. නිශේධ බලය :ඩ්‍ඵද ඡදඇර– ඇති මේ රටවල් දෙකේ විරෝධය එම යෝජනාව න්‍යාය පත්‍රයට ගෙන ඒම ප්‍රතික්ෂෙප වීමට ප්‍රධානතම රුකුල විය.

ඒ සමගම සර් ජෝන් හෝම්ස් ලංකාව ගැන නිරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරමින් එල්ටීටීඊයට බලපෑම් කළ හැකි සෑම අයෙක්ම කළ යුත්තේ ඒ කොටින් විසින් බලෙන් හිරකරගෙන ඉන්නා අසරණ ජනතාව මුදාහරින ලෙස කොටින්ට බලපෑම් කළ යුතු බවයි.

එසේම එම වාර්ථාව මත පිහිටා බොහෝ නියෝජිතයන් කියා සිටියේ කොටි සංවිධානය වහාම ආයුධ බිම තැබිය යුතුය යන්නය. ආරක්ෂක මණ්ඩලයේ සභාපතිත්වය දරණ ජපානයේද, තුර්කිය, බ්‍රිතාන්‍යය, ඇමරිකාව, ප්‍රංශය වැනි ප්‍රබල නියෝජිතයන් රාශියකගේම තදබල විවේචනයට කොටි ලක්වූ අතර, එල්ටීටීඊය ලෝකයේ විවිධ රටවල් විශාල සංඛ්‍යාවක් විසින් තහනම් කරන ලද සංවිධානයක් බැවින්ද, උන් විසින් සිවිල් වැසියන් මරාදැමීම, ඔවුනට තර්ජනය කිරීම් ආදිය නවතා දැමිය යුතු අතර, එම ජනයාට නිදහසේ පිටවීයාමට ඉඩදිය යුතු බවත්, එසේම මෙම ප්‍රශ්නය ශ්‍රීලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නයක් බවත් අවධාරණය කරමින් ඒවා ආරක්ෂක මණ්ඩලයේ සාකච්ඡාව සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස ගෙනඑන ලද යෝජනාව තරයේ ප්‍රතික්ෂේප කරන ලදී.

මේ සියළු කටයුතුවලදී අප රජය නොසැලී එකම ස්ථාවරයක සිටීමද මේ සතුරුබලවේග කපාහැරලීමට දිගටම ගෙන යන වැඩපිළිවෙලද, මේ අතරතුර ශ්‍රීලංකා හමුදා සේනාංක සටන දිගටම ගෙනයමින් අද මේ ත්‍රස්තවාදීන් කොටුකර අවසාන පරාජයේ මුඛයටම ගෙන යමින් සිටින ආකාරය ද අති ප්‍රශංසනීයය. එසේම අපේ නියම මිතුරන් වශයෙන් කෙලින්ම ඉදිරිපත්වූ රුසියාව සහ චීනයට අප රටවැසි සියල්ලන්ගේ කෘතඥපූර්වක ස්තුතිය සහ භක්ති ප්‍රණාමය හිමිවෙයි.

යුද්ධය ඉල්ලුවේ අප නොවේ. හැම අවස්ථාවේදීම කොටි ත්‍රස්තවාදීන් විසිනි. දැන් කළ යුත්තේද, දැන් සිදුවෙමින් පවතින්නේ ද දෙමළ කොටි ත්‍රස්තවාදය ශ්‍රීලංකා ධරණීතලයෙන් නැත්තටම නැතිකර දැමීමේ යුද්ධය අවසාන තිත දක්වාම එකම ස්ථාවරයක පිහිටා ගෙන යාමය. යුද්ධය යනු යුද්ධයමය.

# ත්‍රස්තවාදයෙන් ගම් සුරකින සිවිල් ආරක්ෂක බලකාය



සිවිල් ආරක්ෂක අධ්‍යක්ෂ ජෙනරාල් රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා



අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නන්දන විජේරත්න මහතා

**ශ්‍රී**ලංකාවේ උතුරේ ත්‍රස්තවාදය ඇතිවූ මුල් අවධියේ කොටි ලොවට පෙන්නුම්කළේ එය ත්‍රස්තවාදයක් නොව රජයට එරෙහිව කරන විමුක්ති සටනක් ලෙසිනි. ලංකාවේ බොහෝ දෙන ද එය තේරුම් ගත්තේ ඒ විදියටය. එහෙත් ඉතා ඉක්මනින් කොටින්ගේ සැබෑ අරමුණ පෙනෙන්ට වූයේ උන් ගම්මාන වලට පැන එහි සිටින සිංහළ මිනිසුන් ඉවක් බවක් නැතුව අත දරුවගේ පටන් මහල්ලා දකිවා පෙතිගසමින් සිංහළ සංහාරයක යෙදෙන්නට පටන්ගත් කල්හිය. මෙම කොටි තර්ජණ දිනෙන් දින උතුරු නැගණහිර ගම්මාන වලට එල්ල වෙත්ම සිංහළ මිනිස්සු ඒ ගම් අතහැර දකුණට එන්නට පටන්ගත්හ. කොටින්ට අවශ්‍යව තිබුණේ ද එලෙස සිංහළයා බියවද්දා උතුරුකරයෙන් පන්නා දමා ඊළම් රාජ්‍යයට මායිම සුද්ධකර ගැන්මට ය.

ගම්මාන රාහියකට නිතිපතා කොටි තර්ජණ එල්ල වන්නට පටන්ගත් විට පොලීසියට සහායවීම පිණිස 1985 දී එම ත්‍රස්තවාදී තර්ජණ එල්ලවුණු ගම් වල තරුණයින් බහුතරයකින් සැදුම්ලත් ග්‍රාමාරක්ෂක හමුදාවක් රජය විසින් පිහිටුවන ලදී. 2006 අගෝස්තු 02 දින ගත් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ග්‍රාමාරක්ෂක හමුදාව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන් තුව යයි නව දෙපාර්තමේන්තුවක් වශයෙන් නම්කර ක්‍රමවත්ව පිහිටුවන ලද්දේය. ඊට අයත් කාර්‍යයන් මෙසේය.

රටතුළ උද්ගතවන ආරක්ෂක තත්වයන් අනුව අවස්ථාවට උචිත පරිදි සන්නද්ධ සේවාවන්ට සහ පොලීසියේ කටයුතු වලට උපකාරී පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම, ත්‍රස්ත තර්ජන ඇති ගම්මාන ආරක්ෂාකරගැන්මට කටයුතු කිරීම, නීතිය හා සාමය සුරැකීමට හමුදාවට සහ පොලීසියට සහායවීම, ජාතික උත්සවවල දී ආරක්ෂා සළසන කටයුතුවල නිරතවීම, ගංවතුර, නායයෑම්, සුනාමි ආදී විවිධ ආපදාවන්හිදී ඒවා සමනය කෙරෙන කටයුතුවලට සහායවීම, සමාජ සුබසාධන කටයුතු සහ රජය විසින් නියම කරනු ලබන විශේෂ කාර්‍යයන්හි නිරතවීම ආදියයි.

කොටි ත්‍රස්තවාදය උතුරු නැගණහිර ගම් බිලිගනිත්ම ග්‍රාම ආරක්ෂක භටයා සිවිල් ආරක්ෂක භටයා යනුවෙන් පුළුල් අර්ථයෙන් ඔහුට මනා යුද පුහුණුවක් දීමට සිවිල් අමාත්‍යාංශය කටයුතු ආරම්භ කළාය. මේ අනුව මෙම සේවයට ස්වේච්ඡාවෙන් අනුගත වන පිරිමි හා කාන්තා දෙපක්ෂයටම විශේෂිත පාඨමාලා නිර්මාණය කරන ලද්දේ ය.

නන්දිමිත්‍ර පාඨමාලාව යටතේ මූලික යුධ ශිල්ප, ප්‍රතිත්‍රස්ත්‍ර යුධක්‍රම, මූලික රණබිම් ක්‍රම, ආත්ම විශ්වාස පුහුණුවද, පුනරීක්ෂණ පාඨමාලාව යටතේ කල්පිටිය හමුදා පුහුණු පාසැලේදී අවි ආයුධ පිළිබඳ මනා අවබෝධය සහ ඒවා පරිහරණ පුහුණුවද, ප්‍රථමාධාර, සංඥා, බිඳහෙලීම් හා අවි සීරුමාරු විශේෂ පාඨමාලාවද, වැදගත් ස්ථාන ආරක්ෂා කිරීමේ පාඨමාලාව හා මූලික ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව ද, වන ජීවී හා වන සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ මුළුව ආදී වශයෙන් සිවිල් ආරක්ෂක බලකාය ශක්තිමත්ව ගොඩනැගීමේ කාර්‍යය ආරක්ෂක අමාත්‍යාංශය තව තවත් ඉදිරියට ගෙන යන ලදී. මේ නිසා පෙර නොවූ විරු ධෛර්‍යයක් හා ශක්තියක් සිවිල් ආරක්ෂක සේවයට එකතුවිය. මේ නිසාම පසුගිය කාල වකවානුව තුළ කොටි ත්‍රස්ත වාදීන්ට ගම්වලට පැන ගම්වැසියන් ඝාතනය කිරීම නොහැකිවිය. එයම සිවිල් ආරක්ෂක බලකායේ කාර්‍යක්ෂමතාව පැහැදිලි කරන සාධකයකි. එසේම ඔවුන් නිසා උතුරු නැගණහිර නටබුන් හා වනජීවීන්ද ආරක්ෂාව ලබන්නේ ය.

සාමාන්‍ය ත්‍රිවිධ හමුදාවේ සේවයේ යෙදුණු භටයින්ට අයත් සේවය ප්‍රධාන වශයෙන් රටේ ආරක්ෂාව සැළසීමය. එහෙත් සිවිල් ආරක්ෂක සේනාංකයේ කාර්‍යයන් ලෙස නම්කර ඇත්තේ තර්ජිත ගම්මානවල ආරක්ෂාව තහවුරු කිරීම, ගම්වැසියන්ට ගමෙහි රැඳී සිටීමට ආත්ම විශ්වාසයක් ලබාදීම, ගම්බිම් අතහැර ගිය ගම් වැසියන්ට යළි පැමිණීමට විශ්වාසයක් ගොඩ නැගීම ආදී විවිධ ක්‍රියාදාමයන්ය. එය සිවිල් ආරක්ෂක තත්වයේ උපරිම තලයට යායුතු ගමනකි. එය මෙසේ දැක්විය හැකිය. ත්‍රස්තවාදය නිසා ජනතාව ගම් දමා යන බව සැබෑ නමුත් එසේ කරන්නේ ත්‍රස්තවාදය නිසාම නොවේ. ඒ පළාත්වලට බලපාන වෙනත් ප්‍රශ්නද නිසාය. ඔවුන්ට ආර්ථික අපහසුකම් ඇත. ඒ ගම්වලට හරිපාරවල් නැත. රෝහලක් අසලක නැත බස් ධාවනයක් නැත. කුඩා ළමයින්ට පෙර පාසැල් නැත. ඒවායේ උගන්වන්නට ගුරුවරු නැත. වවාගන්නා එළවළු භෝග ආදිය විකුණා ගන්නට ක්‍රම නැත. මේ ප්‍රශ්නවලදී ගමට සහාය වීමට සිවිල් භටයා යොදවා ඇත. ගම්වැසියන්ගේ ජීවන ප්‍රශ්නවලට කිසියම් විසඳුමක් ලැබෙන සේ ක්‍රියාකිරීමද ඔහුගේ සේවයේ අංශ යක්ව පවතී. උතුරු නැගණහිර ජනතාව ගම් දමා යාම අත් හරින්නට මූලික හේතුව සිවිල් ආරක්ෂකයින් ඔවුන්ට සමීපව සිටීමය. මේ නයින් බලන කල සිවිල් ආරක්ෂක භටයින්ගේ සේවය බෙහෙවින් සංකීර්ණ එසේම ඉතා ඵලදායී සේවයකි.

මේ සියල්ල යථාපරිදි ක්‍රියාත්මක වීමට මූලික හේතුව මේ සිවිල් බලකාය භාරව සිටින කාර්‍යක්ෂම නිලධාරීන් දෙදෙන නිසා බව පැහැදිලිය. ඒ දෙදෙන නම් අධ්‍යක්ෂ ජෙනරාල් රියර් අද්මිරාල් සරත් වීරසේකර සහ අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් ජ්‍යොෂඨ පොලිස් අධිකාරී නන්දන විජේරත්න ය.



සිවිල් ආරක්ෂක බළඇණියේ භටයින් ශ්‍රීලංකා යුද හමුදාව යටතේ සැබෑ යුද පුහුණුව ලබමින් සිටින අවස්ථාවකි මේ.




ශ්‍රීලංකා ආරක්ෂක ලේකම් ගොඨාභය රාජපක්ෂ මහතා පුහුණුව ලබා භටයින් විසිර යන උත්සවයේදී සිවිල් ආරක්ෂක භටයෙකුට පුහුණුව ලත් බව දැක්වෙන සහතික ලාංඡනය පළඳවන අයුරුය මේ..

සිවිල් ආරක්ෂක හමුදාවෙන් පසුගිය වසර කීපය පුරා මේ දවස දක්වා කොටි ත්‍රස්තවාදය මැඩලීම සඳහාත් තර්ජිත ගම් නියම්ගම් ආරක්ෂාකිරීම පිණිසත් විශාල කාර්‍යභාරයක් ඉටුවූ බව අවිවාදයෙන් පිළිගත යුතු කරුණකි. දැනට 45,000 ක පමණ සංඛ්‍යාවක් පිරිමි හා කාන්තාවෝ සිවිල් ආරක්ෂක සේවයේ නිරතව සිටිති. ඔවුනට පැවරුණු රාජකාරී බොහෝ ප්‍රමාණයක් ඇතත් ඔවුනට සාමාන්‍ය හමුදා සෙබළ සමූහයාට ඇති වරප්‍රසාද කිසිවක් නැත. සිවිල් භටයෙකු ලබන මාසික දළවැටුප සාමාන්‍ය සෙබළෙකුගේ වැටුපෙන් අඩකටත් වඩා අඩුය. හමුදා සෙබළෙකුට මූලික පඩියට අමතර විවිධ දීමනා ගණනාවක් ලැබේ. ගෙවල් කුලී, නිල ඇඳුම් ආදී වශයෙන් දීමනාද, නොමිලේ ඉඳුම් හිටුම් පහසුකම්, රණවිරු නිවාස යෝජනා ක්‍රම මගින් නොමිළේ ඉඩම් හා නිවාස, දූ දරුවන්ට උසස් මට්ටමේ පාසැල් හා ශිෂ්‍යත්වද ලබන නමුත් සිවිල් ආරක්ෂක භටයෙකුට ඒ කිසිදු දීමනාවක් නොලැබේ. එහෙත් ඔව්හු කිසිදු මැසිවිල්ලක් නොනගා රට දැය රකින්නට කරන කාර්යය නොපිරිහෙළා ඉටුකරති. මේ අභීත මිනිසුන් වෙනුවෙන් සාධාරණය ඉටුකරන්නට රජයට යෝජනාකර ඇති බව දැනගන්නට ඇත. ඉතා නුදුරේදී ඒ දේ ඒ අයුරින්ම ඉටුවෙනවා ඇතියි අපේක්ෂා කරමු.

♦ **කමනි ඉරේෂා මාකලන්ද Weybridge, Surrey UK**